#  ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2194/72 - 2020 සැප්තැම්බර් මස 25 වැනි සිකුරාදා - 2020.09.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (x) (අ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25 අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී. බී. 1437 සහ කොළඹ 04, ආර්. ඒ. ද මෙල් මාවත, ද ක්‍රෙස්ටර් පෙදෙස, අංක 36 යන ස්ථානයෙහි පිහිටා ඇති ආයතනයක් වන ඉන්ටර්නැෂනල් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, උසස් අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ කාර්ය සඳහා මෙහි II වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති, එයට අනුරූපීව මෙහි II වන උපලේඛනයේ II වන තීරයේ අදාළ කෙටි යෙදුම දක්වා ඇති උපාධිය ප්‍රදානය කිරීම සඳහා යොමු කරන්නා වූ උපාධිය ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් ඉන්ටර්නැෂනල් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ලිමිටඩ් ආයතනය මෙම නියමය මගින් පිළිගනු ලැබේ :-

I වන උපලේඛනය

කොන්දේසි

1. ඉන්ටර්නැෂනල් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ලිමිටඩ් ආයතනය මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධියට අදාළ උපාධි පාඨමාලාව කොළඹ 04, ද ක්‍රෙස්ටර් පෙදෙස, ආර්. ඒ. ද මෙල් මාවත, අංක 36 යන ස්ථානයෙහි දී පමණක් පැවැත්විය යුතු ය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලැබිය යුතු පාඨමාලා ප්‍රතිසමාලෝචනය කිරීමකට යටත්ව, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා, ඉන්ටර්නැෂනල් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ලිමිටඩ් ආයතනයට අවසර දෙනු ලැබේ.

3. ඉන්ටර්නැෂනල් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධියට අදාළ උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත කර ගැනීමේ දී :-

   (අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ වාණිජ්‍ය විෂයය ධාරාවෙන් සාමාන්‍ය සමාර්ථ ('S') තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම ; හෝ

   (ආ) නිශ්චිත බලධරයා විසින් පිළිගත් එයට ඇඳුනු පාඨමාලාවක් සමග අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ කවර හෝ විෂයය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ ('S') තුනක් (3) එකවර ලබා තිබීම.

   යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

1A - PG 5145 — 520 (2020/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

II වන උපලේඛනය

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව | බීබීඑම් ගෞරව |

මහාචාර්ය **ජී. එල්. පීරිස්,**
අධ්‍යාපන අමාත්‍ය.

2020 සැප්තැම්බර් මස 23 වැනි දින,
කොළඹ දී ය.

10 - 429

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.